# ශ්‍රී ලංකා වරාය අධිකාරිය

## තනතුරු ඇබෑර්තු

පහත සඳහන් තනතුර සඳහා අවශ්‍ය සුදුසුකම් සපුරා ඇති පුද්ගලයින්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

## සහකාර නාවික හා භාරන යාත්‍රාපති තනතුර

**(අ) යෝග්‍යතාවය :**

දෙවරකට නොවැඩි වාර ගණනකදී ගණිතය, සිංහල/දෙමළ භාෂාව සහ ඉංග්‍රීසි ඇතුළුව විෂයයන් හය (06) කින් අ. පො. ස. (සා/පෙළ) සමත්වීම.

සහ

වෙරළාන්ත මුහුදු ගමන්වල යෙදෙන දළ බර ටොන් 500 ට අඩු නැව්වල සුපරීක්ෂණ භාර නිලධාරියෙකු වශයෙන් සේවයේ නියැලීම පිණිස ශ්‍රී ලංකා වෙළඳ නැව් අධ්‍යක්ෂ (ජනරාල්) විසින් නිකුත් කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ ප්‍රවීණතා සහතිකයක් හෝ ඕස්ට්‍රේලියානු හෝ ඉන්දියානු රජයන් විසින් නිකුත් කරනු ලැබූ ඒ හා සමාන ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

හෝ

ශ්‍රී ලංකා වෙළඳ නැව් අධ්‍යක්ෂ (ජනරාල්) විසින් නිකුත් කරනු ලැබූ හෝ පිළිගනු ලැබූ වෙනත් උසස් මට්ටමේ ප්‍රවීණතා සහතිකයක් හෝ ඕස්ට්‍රේලියානු හෝ ඉන්දියානු රජයන් විසින් නිකුත් කරනු ලැබූ ඒ හා සමාන ප්‍රවීණතා සහතිකයක් ලබා තිබීම.

සමඟ

**(ආ) පළපුරුද්ද :**

නාවික සුපරීක්ෂණභාර නිලධාරියෙකු ලෙස වසර එක (01) ක මුහුදු ගමන් පළපුරුද්ද

**(ඇ) වැටුප**

| | | |
|---|---|---|
| වැටුප් කාණ්ඩය | : | 6 : 1 (SG 1) |
| ආරම්භක වැටුප | : | රු. 48,150/- |
| වාර්ෂික වැටුප් වර්ධකය | : | රු. 1,035/- |

දීමනා ඇතුළුව මාසික දළ වැටුප රු. 122,400/- ක් පමණ වේ.

### වයස් සීමාව

ඉහත සඳහන් තනතුර සඳහා ඉල්ලුම් කරනු ලබන සියලුම අයදුම්කරුවන් වයස අවුරුදු 45 ට අඩුවිය යුතුය. (මෙම වයස් සීමාව රාජ්‍ය අංශයේ හෝ රාජ්‍ය සංස්ථාවල අයදුම්කරුවන් කෙරෙහි බල නොපායි.)

ශ්‍රී ලංකා වරාය අධිකාරිය විසින් දැනටමත් සම්පාදනය කර ඇති හෝ මින් ඉදිරියට සම්පාදනය කරනු ලබන හෝ සියලුම නීතිරීතිවලට අනුකූලව පත්වීම් ලබන්නන් කටයුතු කළයුතු වේ.

තෝරාගත් අපේක්ෂකයින් ශ්‍රී ලංකා වරාය අධිකාරියට අවශ්‍ය වන පරිදි අධිකාරියේ ඕනෑම කොට්ඨාසයක / අංශයක සහ දිවයිනේ ඕනෑම පෙදෙසක සේවය කිරීමට බැඳී සිටී.

අයදුම්පත් වයස, අධ්‍යාපන, වෘත්තීය සුදුසුකම්, පළපුරුද්ද පිළිබඳ සහතිකවල ඡායා පිටපත් සමග ප්‍රධාන මානව සම්පත් කළමනාකරු, ශ්‍රී ලංකා වරාය අධිකාරිය, කොච්චිකඩේ, කොළඹ 13. යන ලිපිනයට ලැබෙන සේ 2023-06-15 වන දින හෝ ඊට පෙර ලියාපදිංචි තැපෑලෙන් හෝ විද්‍යුත් තැපෑලෙන් (slpahrex@slpa.lk) එවිය යුතුයි. අයදුම්පත බහා එවන කවරයේ වම්පස ඉහළ කෙළවරේ ඉල්ලුම් කරන තනතුර සඳහන් කළ යුතුය.

**අදාළ සහතිකවල පිටපත් අමුණා නොමැති අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.**

මෙම දැන්වීම www.slpa.lk යන වෙබ් අඩවියේද පළ කරනු ඇත.

රාජ්‍ය සේවයේ හෝ රාජ්‍ය සංස්ථා සේවකයින්ගේ අයදුම්පත් ඔවුන්ගේ දෙපාර්තමේන්තු / සංස්ථා ප්‍රධානීන් මාර්ගයෙන් ඉදිරිපත් කළ යුතු අතර, ඉහත තනතුරු සඳහා අයදුම්කරු තෝරාගනු ලැබුවහොත් අදාළ දෙපාර්තමේන්තු / සංස්ථා සේවයෙන් මුදා හැරීමට එකඟ වන බවට එහි සටහන් කර තිබිය යුතුය.

**සභාපති**